රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :05/2009

මගේ අංකය: ආ/8/3/706/144
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2009 පෙබරවාරි මස 24 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

"දැයට කිරුළ - රට දිනන හෙට දිනට" ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට
**සහභාගීවන නිලධාරීන් සඳහා යැපීම් දීමනා ගෙවීම**

2009 ජාතික නිදහස් දිනයට සමගාමීව "දැයට කිරුළ" ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ රාජකාරි කටයුතු සඳහා සහභාගීවූ නිලධාරීන්ට 2009.01.26 දින සිට 2009.02.09 දින දක්වා වෙනත් කිසිදු දීමනාවක් නොගෙවීමට යටත්ව පහත සඳහන් පරිදි දීමනා ගෙවීම අනුමත කරමි.

**I. මාණ්ඩලික නිලධාරීන්**

| | | |
|---|---|---|
| අ. | සතියේ දිනක තම නිත්‍ය රාජකාරි වේලාවට අමතරව පැය 04 කට වැඩි සේවා කාලයක් සඳහා | දිනකට - රු. 1000/- |
| ආ. | සති අන්ත හා රජයේ නිවාඩු දිනක පැය 08 කට වැඩි සේවා කාලයක් සඳහා | දිනකට - රු. 2000/- |

**II. මාණ්ඩලික නොවන අතිකාල අහිමි නිලධාරීන්**

| | | |
|---|---|---|
| අ. | සතියේ දිනක තම නිත්‍ය රාජකාරි වේලාවට අමතරව පැය 04 කට වැඩි සේවා කාලයක් සඳහා | දිනකට - රු. 750/- |
| ආ. | සති අන්ත හා රජයේ නිවාඩු දිනක පැය 08 කට වැඩි සේවා කාලයක් සඳහා | දිනකට - රු. 1500/- |

**III. අතිකාල හිමි සියලුම නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව අදාල කාල සීමාව සඳහා අතිකාල දීමනා ගෙවීම.**

02. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිව නිකුත් කරන ලදි.

ඩී. දිසානායක (signature)

**ඩී.දිසානායක**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**